# ජගත් ජේ එදිරිසිංහ

# පිපිණි 8

මුලු ගමනේදී ම අමන්දි දිග කල්පනාවකට වැටී සිටිනු විශ්වජිත් දුටුවේ ය. ඒ කල්පනාව බිඳින්නට ඔහුට අවශ්‍ය නොවී ය.

"අපි මොනවා හරි කාලා කෝපි එකක් බොමු ද..." ඔහු කුලී රියෙන් බට වහාම ඇසුවේ ය.

"මට එපා.. මං බීලයි ආවෙ.." අමන්දි කීවා ය. ඔහු සිනාසුණේ ය.

"ඔයා බිව්වට මං බීලා නැහැනෙ.. කොටින්ම මං තාම උදේට කාලත් නැහැ.. ඒ නිසා මං වෙනුවෙන් ඔයාට කෝපි එකක් වත් බොන්නම වෙනවා.." ඔහු කිවේ ය. අමන්දි සිනා සී ඔහු හා එකඟ වූවා ය.

කුඩා ආපන ශාලවෙන් උදෑසන ආහාරය ගන්නා අතර ඔහු චිත්‍ර ශිල්පය පිළිබඳව බොහෝ දේ ඇය හා දෙඩුවේ ය. ඔහුගෙන් අසන්නට බොහෝ දේ ඇගේ සිතේ වූ නමුදු ඇය ඒ කිසිවක් නොඅසා ඔහුට කන් දී සිටියා ය. කෑමට පිරියක් නොතිබුණා ද ඇය ඔහු සතුටු කිරීම සඳහා කුඩා සැන්විචයක් අතගාමින් සිටියා ය.

ඉන්දියාවේ අජන්තා බිතු සිතුවම් පිළිබඳවත් ඊජිප්තුවේ පිරමීඩ තුළ ඇඳ ඇති අගනා සිතුවම් පිළිබඳවත් ඔහු කතා කළේ ය. සීගිරියේ සිතුවම් වල ත් අජන්තාවේ සිතුවම් වලත් ඇති ගැලපීම් ඔහු විස්තර කළේ ය. ඔහුට ඒ පිලිබඳව අවුරුද්දක් හෝ නොනැවතී කතා කළ හැකි තරමේ දැනුමක් හා අවබෝධයක් ඇති බව ඇය වටහා ගත්තා ය. ඔහුගේ මහා දැනුම් සම්භාරය ඉදිරියේ මේ විෂයය පිළිබඳ තමාගේ අල්ප මාත්‍ර දැනුම පිළිබඳව ඇය ලැජ්ජාවෙන් ඇකිළී සිටියා ය.

"ඔයා කන්නෙ නැහැනෙ.. අතගානවා විතරයි.." ඔහු එකවරම සිය මාතෘකාවෙන් බැහැර වෙමින් කීවේ ය. "කන්න කන්න.. අපි ගොඩක් වෙලා අද මෙතන ඉන්නවා.."

"ගොඩක් වෙලා..?"

"ඔව්... ගොඩක් වෙලා.."

000000

ඒ දිනය සැබැවින්ම සුන්දර දිනයක්ම විය. ඔහු බොහෝ චිත්‍ර ශිල්පීන් අසළ නැවතී ඔවුනගේ ශිල්ප ක්‍රම පිළිබඳව ඇයට බොහෝ දේ කියා දුන්නේ ය.

"බලන්න මේ හැම ආටිස්ට් කෙනෙකුටම ඒ ඒ අයට ආවේනික වෙච්ච ශිල්ප ක්‍රම තියෙනවා.. ඒක තමයි චිත්‍ර ශිල්පයේ විස්මය.. හැම චිත්‍ර ශිල්පියෙක්ම අනෙකාගෙන් වෙනස්... ඒ අය අතින් ඇඳෙන සියුම් රේඛාවක් ගත්තත් ඒ හැම එකක්ම එකිනෙකට වෙනස්.. බලන්න තේරුම් ගන්න පුලුවන්ද කියලා.. ලංකාවෙ මගෙන් ඉගෙන ගන්න ළමයින්ට මෙව්වා පෙන්නන්න නැති එක ගැන මට දුකයි.." ඔහු කීවේ ය.

"එන්න.." ඔහු ඇගේ අතින් අල්ලා ගත්තේ ය. ".. මට ඔයාට පෙන්නන්න දෙයක් තියෙනවා.." ඔහු ඇය ඇදගෙන ම වීදියේ කෙළවරක සිටි චිත්‍ර ශිල්පියා වෙත ගියේ ය. ඔහු තමා ඉදිරියේ වාඩි වී සිටි මහළු පුද්ගයකු සිතුවමට නගමින් සිටියේ ය. මහළු මිනිසාගේ රැළි වැටුණ මුහුණ කැන්වසය මත ජීවමාන වෙමින් තිබෙන්නේ යයි අමන්දිට සිතුණි.

"දැක්ක ද..? මං ඊයෙත් මෙයා ළඟට වෙලා පැය ගාණක් බලා හිටියා.. අපට ඉගෙන ගන්න කොයි තරම් දේවල් තියෙනවා ද..? ඇත්තටම අමන්දි අපි මේ මිනිස්සු ඉදිරියෙදි පුංචි කුහුඹුවන් වගේ කුඩායි කියලයි මට හිතෙන්නෙ.." විශ්වජිත් කීවේ ය.

"තමන් ගැන ඔය තරම් අවතක්සේරු කරගන්න එපා.. ඔයා අපේ රටේ ඉන්න දක්ෂම චිත්‍ර ශිල්පියෙක් ය කියන එක අමතක කරන්න එපා.." අමන්දි කීවා ය. ඔහු තවමත් අල්ලාගෙන සිටින තම අත ගලවා ගන්නට ඇයට අවශ්‍ය වුව ද ඒ සඳහා ශක්තියක් තමාට නොමැති බවක් ඇයට දැනුණි. ඒ අතේ සියුමැළි පහස ඇයට සුවයක් දුන්නේ ය.

චිත්‍ර ශිල්පියා තමා අඳිමින් සිටි සිතුවම ඉක්මනින් නිම කළේ ය. මහළු මිනිසා ඔහුට යම්කිසි ගාස්තුවක් ගෙවා සිතුවම මිලට ගත්තේ ය.

"අමන්දි.. අතනින් වාඩි වෙන්න.." විශ්වජිත් මහලු මිනිසා වාඩි වී සිටි පුටුව ඇයට පෙන්වා කීවේ ය. ඈ ඔහුගේ මුහුණ බැලුවේ පුදුමයෙනි.

"වාඩිවෙන්න.." ඔහු නැවත කීවේ ය.
"මට බැහැ.." ඈ මුරණ්ඩු ලෙස කීවා ය.
"අනේ වාඩිවෙන්න.. මං කැමතියි මේ මනුස්සයා ඔයාගෙ පෝට්‍රේට් එකක් කරනවා බලාගෙන ඉන්න.. ප්ලීස්.." ඔහු ආයාචනා කළේ ය.

"මං සල්ලි ගෙනාවෙත් නැහැ.. " අමන්දි අදිමදි කළා ය.
"ප්‍රශ්නයක් නැහැ .. මා ගාව තියෙනවා.. ප්ලීස් ඩාවිවෙන්න.." ඔහු කීවේ ය.

අමන්දි ඉතා අකැමැත්තෙන් පුටුවේ වාඩි වූවා ය. විශ්වජිත් චිත්‍රශිල්පියා සමඟ යමක් සාකච්ඡා කරනු ඇය දුටුවා ය. යමක් ඉගෙන ගන්නට ඔහු තුළ තිබූ ඇති මහත් ආශාව පිලිබඳව ඇය විස්මයට පත් වූවා ය.

චිත්‍ර ශිල්පියාගේ තීක්ෂණ ඇස් හමුවේ නොසෙල්වී වාඩි වී සිටින්නට අමන්දි උත්සාහ ගත්තා ය. විශ්වජිත් චිත්‍රශිල්පියා පසු පසට වී ඔහු ඇගේ රුව සිතුවමට නගන අයුරු මහත් ඕනෑකමකින් බලා සිටියේ ය. ඒ අතරතුර ද ශිල්පියාගෙන් අසන්නට බොහෝ දේ ඔහුට තිබුණි. විශ්වජිත් ගේ කන්කරච්චලයෙන් චිත්‍රශිල්පියා දැන් දැන් කෝප ගනු ඇතැයි අමන්දිට සිතුණි.

සිතුවම නිම කළ චිත්‍ර ශිල්පියා ඒ දෙස බලා සිටියේ මහත් සතුටකිනි.

"අයෑම් රියලි හැපි විත් දිස්.." ඔහු නුහුරු ඉංග්‍රිසි උච්ඡාරණයක් ඇතිව කිවේ ය. "අයි තින්ක් අයි සක්සස්ෆුලි ග්‍රැබ්ඩ් ද සෑඩ්නස් දැට් අයි සෝ ඉන් යුවර් වයිෆ්ස් අයිස්.."

විශ්වජිත් පිළිතුරු ලෙස සිනාසුණේ ය. ඔහු චිත්‍රශිල්පියා අතින් සිතුවම ගත්තේ මහත් ලෝබ කමකිනි.

"මේ බලන්න.." ඔහු ඈත සිට එය අමන්දි දෙසට හරවා පෙන්නුවේ ය. ".. හරිම අපූරුයි.."

අමන්දි ඒ දෙස බැලුවේ ඕනෑ කමකින් නොවේ. ඇගේ ඇස් මහත් කණගාටුවකින් පිරී ඇති බව විශ්වජිත් පළමු වතාවට නිරීක්ෂණය කළේ ය. ඇය පිළිබඳ සියුම් කණගාටුවක් ඔහු සිතේ කොණක මතුව ආවේ ය. ඔහු අමන්දි වෙත ගොස් ඇගේ දකුණතින් අල්ලාගත්තේ ය.

"මං මේ පෝට්‍රේට් එක තියාගන්නවා අමන්දි.." ඔහු කීවේ අවසර ඉල්ලන්නාක් මෙන් ය.

"මොකටද..?" ඈ ඇසුවා ය.

"ඒක හොඳ නිර්මාණයක්.. නිකම්ම නිකම් පෝට්‍රේට් එකක් නෙවෙයි.. එයින් ඔබ්බට ගිය සුවිශේෂී නිර්මාණාත්මක බවක් මේකේ තියෙනවා.."

"කමක් නෑ.." අමන්දි සුසුමක් හෙලුවා ය. ".. ඔයා ඕක තියාගන්න.. නිර්මාණාත්මක බවක් තිබුණත් නොතිබුණත් දවසක මාව මතක් වෙන්න ඔයාට ඕක ඕනෙ වෙයි.." අමන්දි මොහොතක් කතාව නවතා බලා සිටියා ය. ".. මං නැති දවසක.." ඇය දෙවෙනුවට එකතු කළා ය.
00000

විශ්වජිත් නවාතැනට ගියේ අවුල්ව ගිය මනසකින් යුක්තව ය. අමන්දි හා සම්බන්ධ සිදුවීම් ඔහු සිත විශාල වියවුලකට පත් කොට තිබුණි.

"මම හෙටත් එන්නම්..." සවස ඇය ඇරලූ මොහොතේ ඔහු කීවේ ය.

"ඒ කොහොම ද..?" ඇය ඇසුවේ පුදුමයෙනි. " ..ඔයා හෙට ආපහු ලංකාවට යනවා නේද..?"

"නැහැ.." ඔහු කිවේ ය. ".. මම තව ටික දවසක් ඉන්න හිතාගත්තා.." එය ඒ මොහොතේ ගත් ක්ෂණික තීරණයක් විය. ඒ තීරණය ගැනීමට ඔහු දෙවරක් නොසිතුවේ ය.

"ඇයි...?" අමන්දි ඇසුවා ය. දිය යුතු පිළිතුර කුමක්දැයි ඔහු කල්පනා කරමින් සිටියේ ය.

"ඇයි හෙට නොයන්න හිතුවෙ..?" අමන්දි නැවත ඇසුවා ය.

"මට ඉවර කරන්න තව වැඩක් තියෙනවා.." ඔහු කීවේ ය. ".. ඒක ඉවර කරන්නෙ නැතිව ආපහු යන්න හිත දෙන්නෙ නැහැ.."

ඈ සිනාසුණා ය. තමාගේ තීරණය ඇගේ සතුටට හේතුවන්නට ඇතැයි විශ්වජිත්ට සිතුණි. එය ඔහුගේ සිතට ද සැනසීමක් ගෙන දුන්නේ ය.
"ඔයා උදේන්ම ලෑස්ති වෙලා ඉන්න... අපි උදේන්ම යමු..." ඔහු කීවේ ය.

නැවත එන්නට පෙර ඇයට අත දෙද්දී දැනුණ ඇගේ අතේ සිසිලස මේ මොහොතේ දීත් දැනෙයි. ඈ වෙත ඇති මේ අපූරු ආකර්ශන බලය කුමක්දැයි වටහා ගන්නට තමාට නොහැකි බව ඔහු දනියි.



විශ්වජිත් අමන්දිගේ සිතුවම ඔතා තිබූ කඩදාසිය ඉවත් කළේ ය. බොහෝ සීරුවෙන් සිතුවම කන්නාඩි මේසය මත තැබුවේ ය. ඒ දෙස බලාගත්වන ම ඇඳෙහි වාඩි වූයේ ය. ඇගේ දෑසේ ගැබ්ව ඇති ගුප්ත බැල්ම ඇගේ මුවග රැඳි තේරුම් ගත නොහැකි මන්දස්මිතය ඔහු නැවත නැවත නිරීක්ෂණය කළේ ය. එහි ගැබ්වුණ අපූර්වත්වය ඔහු වසඟ කරග්තේ ය. මෙතරම් සියුම් ලෙස හැඟීම් පිළිබිඹුවන සිත්තමක් අඳින්නට හැකියාව ඇත්තේ කීයෙන් කී දෙනෙකුට ද?

ඇගේ සිතුවමක් අඳින්නට ඇත්නම් ය යන